## 408 දකිම් මගේ මවුන්

දකිම් මගේ මවුන් සුරපුරේ දිනේක
මිදී මෙලෝ දුකින් වසම් නිති තුටින්

සුරපුරේ නිතින් දකිම් මගේ මවුන්
සුරපුරේ නිතින් දකිම් මගේ මවුන්

දකිම් මගේ මවුන් සුර සිරින් දිලේමින්
වසයි නිති සැපෙන් පුතුන් ළඟා තෙදින්

දකිම් මගේ මවුන් හිරු රැසින් පැළඳි
තරු සිරින් දිසී සුරලොවේ දිළී

දකිම් මගේ මවුන් සුර දනන් මැදේහි
දිව කිරුල් දැරී වසයි සුපින්වතී

දකිම් මගේ මවුන් රුසිරු ඒතුමීගේ
සිරි බර දෙපා සිඹීම් සැම කලා